පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ශ්‍රේණිය - 9

දෙවන වාරය - අටවන සතිය
(ජූනි මස හතරවන සතිය)

සැකසුම - එච්.ඒ සංජය උදය කුමාර

## සති පාසල කාර්ය පත්‍රිකාව

**පාඩම හෝ ඒකකය - නවතාවයකින් යුතු වෙස්මුහුණක් චිත්‍රණය කරමු.**

නිපුණතාව 3.0 : පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.

නිපුණතා මට්ටම 3.3 : පාරිභාරික අවශ්‍යතා සඳහා නවතාවකින් යුතු සැලසුම් චිත්‍රණය කරයි.

### පෙර ඉගෙනුම් අවස්ථා/ ශිෂ්‍යා කළයුතු කාර්යන්

01. නව තාවයේ වෙස් මුහුණු චිත්‍රණය කරණ ආකාරය, ඒවායේ රේඛා, හැඩතල, වර්ණ, ආකෘතීන්, භාවිත හැඩ, සැරසිලි පිළිබඳව හොඳින් බලන්න. චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය 9 ශ්‍රේණිය (පිටුව,19)

02. වෙස් මුහුණක් චිත්‍රණය කරණ ආකාරය පිළිබඳ සැකසුන වීඩියෝ පට බලන්න. ඒ සඳහා පහත යූ ටියුබ් සබැඳි උදව් කර ගන්න. https://youtu.be/cCUyGoQ-EDk



03. පහත සඳහන් පොත්පත් සොයා කියවන්න.
    චිත්‍ර කලාව 9 ශ්‍රේණිය -තිලකරත්න දිගන්වල මහතා- (පිටුව 64,77)
    චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය 9 ශ්‍රේණිය (පිටුව 18,19)

05. වෙස්මුහුණක් චිත්‍රණයට අවශ්‍යය උපකරණ රැස්කර ගන්න.
    * ඩ්‍රෝවින් කඩදාසි * පිටපත් කරන ට්‍රේසින් කඩදාසි * ජ්‍යාමිතික උපකරණ * පැන්සල් * පෝස්ටර් සායම් හෝ දිය සායම් * පින්සල් * කතුරක්,


වෙස් මුහුණක් චිත්‍රණය කිරීමේදී සැලකිය යුතු කරුණු.

01. ශ්‍රීලාංකීය වෙස්මුහුණු හා දේශීය සංස්කෘතීන්ට මෙන්ම සම්ප්‍රධායන්ට අයත් වෙස්මුහුණු ලක්ෂණ හා හැඩතල හඳුනාගැනීම.
02. විදේශීය වෙස්මුහුණු වර්ග හා එහි ලක්ෂණයන් හැඩතල හඳුනාගැනීම.
03. සංකේතාත්මකව වර්ණ කිරීමේ රටා උචිත පරිදි එකතු කිරීම.
04. උචිත ශිල්ප ක්‍රම වෙස්මුහුණු ඇඳීමට භාවිත කිරීම. උදා: අතින් ඇඳීම, වර්ණ කොළ අදාළ හැඩයට කපා ඇලවීම.
05. නිර්මාණය සඳහා ජ්‍යාමිතික උපකරණ උදවු කර ගැනීම.
06. දැනට නිමවා ඇති වෙස්මුහුණු වල භාවිත හැඩ, ආකෘතික ලක්ෂණ, සැරසිලි ක්‍රම පිළිබඳ සොයාබලා තම නිර්මාණයට ඇතුළත් කර ගැනීම.
07. සියුම් නිමාව, අලංකාර හා ආකර්ෂණීය බව රැක ගැනීම.



සරල වෙස් මුහුණක් චිත්‍රණය කිරීමට අදහස් කහිපයක්

01. ඩ්‍රෝවින් කඩදාසිය ගෙන මුහුණේ ප්‍රමාණයට ගැළපෙන පරිදි වෙස්මුහුණේ දළ සටහනක් පැන්සල භාවිතා කර ඇඳ ගන්න. (වටේ ඉර)
02. එක් එක් හැඩතලයන් ඊට එක් කරන්න.



03. උචිත පරිදි ඒ ඒ හැඩතලය ගෙන වර්ණ යොදන්න. උෂ්ණ වර්ණ වැඩිපුර යොදන්න (රතු,කහ,සුදු,රෝස,රඹ) ඉන් ආකර්ෂණීය ස්වභාවය වැඩිවේ. * වර්ණ යෙදීමේදී විවිධ ශිල්ප ක්‍රම භාවිතා කල හැක. (අ) වර්ණ තැවරීම (ආ) වර්ණ ස්ථර කිහිපයක් තවරා සීරීම (ඇ) සරල අච්චු ආධාරයෙන් වර්ණ කිරීම (ඈ) හැඩතල ට්‍රේසින් කොළයකට පිටපත් කර වර්ණ කඩදාසි මත ඇඳ පසුව වර්ණ කඩදාසි කපා ඇලවීම
04. සෑම හැඩතලයක් වටේම තදපැහැයකින් බාහිර රේඛා අඳින්න. ඉන් කදිම නිමාවක් මෙන්ම තියුණු ස්වභාවයක් ලැබේවි.
05. කතුරකින් හෝ පෙපර් කටරයකින් අවශ්‍ය භාහිර කොටස් කපා ඉවත් කරන්න.

ඉගෙනුම් පල :
- විවිධ වෙස් මුහුණු වර්ග පිළිබඳ ව විස්තර කරයි.
- වෙස් මුහුණු සඳහා භාවිත හැඩ, සැරසිලි සහ වර්ණ පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- නිර්මාණාත්මක වෙස් මුහුණක් සඳහා දළ සටහන් අඳියි.
- උචිත ශිල්පක්‍රම භාවිත කර වර්ණ ගන්වයි.
- සංයමයෙන් යුතු ව කටයුතු කරයි.

### භාහිර ඉගෙනුම් අවස්ථා/සහායක ඉගෙනුම් ආධාරක/ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි දේ.

01. පොත්පත් - චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය 9ශ්‍රේණිය (පිටුව 18,19)

02. යූ ටියුබ් සබැඳි - https://youtu.be/Gfnn-IgOiRM
    https://youtu.be/4eZJfP7QHmI

03.ඊ නැණ පියස - https://www.enenapiyasa.lk/lms/course

04. ඊ තකසලාව - https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course

පහත ක්‍රියාකාරකම් වල යෙදෙන්න

01. ඩ්‍රෝවින් කඩදාසි වෙනුවට රෙජිෆෝම් ,ඝන කාඩ්බෝඩ්, ඝනරෙදි, ආදී මාධ්‍ය වල වෙස්මුහුණු ඇඳීමට හුරු වන්න.

02. විවිධ ශිල්ප ක්‍රම වලට වෙස්මුහුණු ඇඳ ප්‍රදර්ශනයක් සඳහා සූදානම් වන්න.